මහ පොළොව වත් නොදන්නා තාලයේ මිනිසෙක්

1. ජීවත්ව සිටියා මෙහි
මහපොළොව වත් නොදන්නා තාලයට
මිනිසෙක්
ගුරු පාරෙන් නිවසට
නිවසින් ගුරු පාරට
ඉන් පිටත තණකොල ගසක් වත්
නො පෑගුණු විලස
ජීවත්වීය මිනිසෙක් මෙහි

2. -බෑරක්ද මේ" අසන අයටත්
-අංකල් කොහේටද" අසන අයටත්
වීය එකම පිළිතුරක්
ඔහුගේ මුවෙහි

3. ඇත තැනක කඩයක
කරදී සුලු සුලු වැඩපල
දිවි ගෙවීය ඉන් ඔහු
මහ පොළොවටවත් නොදැනෙන විලස

4. කලක් ගතවූ තැන
අමුත්තෙකු පැමිණ ගමට
විමසයි තතු ඔහු ගැන
මග හමුවන අයගෙන්

5. -දින කිහිපයක පටන්
පැමිණියේ නෑ කඩයට
වෙනදා නම් එලෙස නෑවිත්
මග ඇරියෙ නෑ නොකියා ම"

6.-හැබෑමයි අපිත් දැක්කෙනෑ
හුඟ දවසකින්
දොර ජනෙල් වසා තිබුනා
දින කිහිපයක් "
ගම්මුද රැස්ව තැන තැන
කරති කසු කුසු කුහුළින

7. දැන් කුමක් කරමුද අපි
කුමක් වීද මොහුට
විපතක් වත් දැයි ගේ තුළ
හැර බලමු දොරවල්අපි

8. රාළහාමිද පැමිණ
එකතු කරගෙන මිනිසුන්
හැර බැලීය දොරවල්
සොයන්නට මොහු ගැන

9. ගෙය පාලුවට ගොස්ය
බැඳී මකුලු දැල් දුඹුලු
විදුලිය නැති නිවස
පිරික්සති විදුලි එළියෙන්

10. නැත කිසි සළකුණක්
ඇඳුම් වැරහැලි සහ
පිඟානක් මැටි කෝප්පයක් හැර
කසිකබල් මේස පොඩ්ඩක් මත
මොනවදෝ පොත් කිහිපයක්

11. සොයන්නට අන්තැනක් නැතිකල
පැමිණියා කෙනෙක් මේසය වෙත
එ මත වූ ලියුමක් රැගෙන කියවීය
ලබන්නට හෝඩුවාවක්

12. මිතුරනි යැයි අමතා
පටන් ගෙන ඇත ලියුම
"මීටත් වඩා නිදහසක් සොයා පිය
නගමි ඇතට"
එවැකි පමණක් වීය ලියුමෙහි

13. කවුද මොහු.. කොහේ ගියේද
කාටත් නොදන්වා
එ පැන සහිතව
කියවති මේසය මත වූ
පැරණි කොපි පොත්

14. -ඒයි මේ බලපන්...
මේ මිනිහගේ කවිද?"
පොත පිරෙන්නට පිටු පිරෙන්නට
අමුණා ඇත අකුරු කැට

15. මග තොට මුණ ගැසුන
මිනිසුන්
උන් ගේ වැහැරුන ජීවිත
නෙතග රැඳී කඳුලු කැට
පණ පෙවී ඇත එ කවි තුළ

16.යුධ බියෙන් ඇළලුන ජීවිත
උන් දකින බියකරු සිහින
නිදි නොමැති දිගු රාත්‍රීන්
කැටි ගැසී ඇත එ කවි තුළ

17. මහ මගට වැටුනු දරුවෝ
මහ මගම ජනිත දරුවෝ
ගං දියට වැටුනු දරුවෝ
හරැන හරැ ඇසේ එ කවි තුළ

18. බොහෝ කලකට පෙර
දලු ලා වැඩුණු ප්‍රේමයක්
දුක් බරව බිඳෙන යුරු
ගැයේ ඒ කවි තුළ

19. කවිරස හඳුනන අය
බෙදාගෙන එ පොත් ටික
කියවමින් විඳිති කවිරස
නොවිඳි ලෙස අන් තැනක

20. වීය අප අතර මෙවන් මිනි-
සෙක්
අප ද නොදැනුවත්වම
ඉටු කරමු අපි ඔහුට යුතුකම්
පළ කරමු මේ පොත් ටික

21 ගෙන සිතට වීරිය
ලැබී අත හිත අවැසි ලෙස
පළ කලෝය ඔවුහු මේ
අතුරුදන් කවියාගේ කවි පද

22. ලැබ මහත් ප්‍රසිද්ධිය
පළවීය පොත් පෙල
බොහො බොහෝ දනන් ඉක්බිති
සොයා එති මෙ කවි ගෙ ගම

23. අතුරුදන් කවියාගෙ
ගම යැයි
ලැබ මහත් හර සර
ගමද විය දියුණු ඉක්බිති
ඉදිවී මහා මාර්ගද

24.ඉදිවිය පිළිමයක්
අතුරුදන් කවියා නමින්
ලැබ මල් මාල හර සර
මැති ඇමති ලොකු උන් අතින්

25. මුලදී එය වසරක් පාසා
පසුව දෙවසරක් තෙවසරක්
ඉන්පසු
ලැබුනු විට ඉඩකඩක් පහසුවක්
ලැබීය පිළිමය හරසර

26. පිළිමය දැන් සිටියි
තවරාගෙන දිය සෙවල
නගරාරක්ෂක බලු කැල
ලගිති පහසුව පිළිම පාමුල

27. ජීවත්ව සිටියා මෙහි
මහ පොළොව වත්
නොදන්නා තාලයට මිනිසෙක්
සෙවල බැඳි පිළිමයක් ද
දිය වූ මතකයක්ද ඉතිරිකර
අතුරුදන් වී බොහෝ කල්
එනමුත් සැබැවින්ම
සිටියා ඔහු ජීවත්ව මෙහි

අනුෂ්ක තිලකරත්න

ගංභාෂය ජන්ද පෙට්ටියට කියූ කවිය

මිනිසාම මට දුන්න
ප්‍රාණවත් කරගත් පදාර්ථ
නොකියාම උන්ටත් හොරෙන්
අඳුරෙම
රහසක් නොවෙන්න
හොර රහසෙන්
අනේ මං දස මාසෙන්
හැදුවා ලපටි බිළින්දෙක්
ගර්භාෂය ජන්ද පෙට්ටියට කියූ කවිය
සිඟිති පැටියෙක් තරුණයෙක්
ටික කලකින් උනා ඌ ලොකු මිනිහෙ-
ක්
උගෙ දෑතින් අඩ අඳුරෙන් නුඹ
කුසෙන්
හැදුවා පැය විසිහතරෙන්
වැදුවා උඹ එකෙක්
අනේ ඌ කිසි දිනෙක
හොරෙක් නොවෙනා
පල් හොරෙක්

ලක්ෂ්මන් කොඩිතුවක්කු

ඔබ තරුවක්

හිරු ඇති අහසේ..
සැඟව සිටි ලොවටම රහසේ..
ඔබ තරුවක්
හිරු නැති අහසේ ..
ලොව ලස්සන කර නික්මෙයි
සිත්සේ..

ඔබ තරුවක්
සඳ ඇති අහසේ..
පාලු මකයි සඳටත් රහසේ..
ඔබ තරුවක්
සඳ නැති අහසේ..
අදහනු බෑ ලස්සන නුඹගේ..
ඔබ තරුවක්..
හිමි නැති පෙම සේ.
දුරකින් සිට නරඹමි රිසිසේ..
ඔබ තරුවක්..
උණු කඳුලක් සේ..
කඩා වටුන දා අගයක් නෑ
පෙරසේ..

භාග්‍යා
කරුණාරත්න

පාර අමදින්නී

කුණු කාණු මඩ වතුර
පිරිත් පැන් කර ගන්න
ගඳ ගහන විසාලා නගරයේ
කවමදාවත් හිතට
ජීවිතේ වැසි නොලද
සැඩොල් කුලයේ උපන් නංගියේ

දිවා රෑ පුරාවට
රජුන් යනෙනා මගට
සුදු සේල ඇතිරුවත් හන්දියේ
උඹේ හිත අමදින්න
කෙනෙක් තවමත් නොලද
මහ පාර අතුගාන නංගියේ

උඹ වගේ හැමදාම
කළුවරේ ඉකිබින්ද
සෝපාකලා උඹේ පන්තියේ
මහා කරුණා ඇසට
උඹව නොපෙනී ගියද
බුදුන් වැඩ ඉන්නවා පන්සලේ

ප්‍රසාද් වීරසේකර

(යෞවන සම්මාන උළෙල -2009 ගීත රචනා දීප ව්‍යාප්ත ප්‍රථම ස්ථානය -පාර අමදින්නී)

මෙහෙණියගෙන් පිලිතුරු

මතකය ඔබේ සිත නොයනා නමුදු හැර
ආපසු බලා පල නැත අප ගෙවූ දුර
නුඹ නැවතුනත් ඔය විලසට හැගුම් තෙර
මම සක්මණින් යම් දකිනට නිවන් ගිර

තේරීගීත කියවා බැලූ දිනේ සිට
සුවපත් කරන්නට ගිණි ගත් සසර මීට
දැගලුවා යට් සිතින් ඇග මස් නහර ඇට
සීලය සැලෙනවද ගිනි කූදු දකින විට

මතකය කරපින්නා ගෙනවිත් පලක් වෙද
පිලිකෙවි කරයි දෙසවන පෙර බඹර නද
තවමත් පැරණි විල්තෙර වක ගසන් ඉඳ
ෂිහිනෙන් ගෑ සුවඳ අත ගා බලන වද

සිහිනය සිහිනයකි නිදිබර දෙනෙත මත
අද මෙහෙණියකි ඔබ දුටු ඒ රුසිරු කත
දහමෙහි සුවය ලබනෙමි පිරි අපිරි මිත
තව තව පමා වී සොහොයුර පලක් නැත

අනුෂා දමයන්ති
රෝම නුවර සිට

උතුරට නෑගම් යමු ගිනි මොළවා

සුබ නැකතට තල මුසු කිරි බතක උයා
රඹපත මත අනුභවකර හිරු දෙවිඳුට සතුට කියා
වැඩ අරඹනට වල බිහි වූ දෙශය නගනු නියා
උතුරට නෑගම් යමු සොහොයුරු නෑදෑ පිරිස සොයා

මෘදංග හඬ මතු වේ ගිනි - අවි නිවි පේදුරු තුඩුවේ
විලංගු ගැලැවී පා යුග - සිලම්බු තාලෙට හැඩුවේ
වයන ගැට බෙර උඩරට - බෙර පද එ හා මුසුවේ
තනන එක ගීයක දැය - මට නව අවුරුදු හමුවේ

පද්මසිරි හේරත්

වෙනසක අරුමය

ඉහළට නැගී වා රැළි තුළ නිසසලව
වැහිකළුවකින් ගිලිහී අතහැර එලොව
වැදෙමින් තැලී පොඩි වී සිරසට ඇලව
පිනි පොද බිම වැටෙයි සොයමින් මහ පොලව

සැනසුම ලබා දී කරුවල මැද රෑ ට
මතුවෙයි උදාහිරු එලි කර පසු දාට
විදුවේ බලය ගත හැකි මුත් හැම දේට
කිසිවිට සොබා දහමින් ඉඩ නැත ඊට

පැල වී ඇටෙන් මහගස් අතුරිකිලි දදා
බිහිකර අළුත් පරපුර මල් කැකුළු හදා
මැරුණත් දිරාපත් වී මහ පොලොව බදා
යුතුකම කරයි වරිගය හැම අතට බෙදා

ගඩොලින් කළුගලින් වැලි හුනු මැටි ඇනුව
ඉදිවුණ මහා මන්දිර අහසට ගොනුව
පොලොවට පහත් වී යම් දවසක දිනුව
අවසන් කරයි ඇතිකරගත් ගනු දෙනුව

දනවන මිහිර අඩු වැඩි කොට නියම රසේ
පැල්පත මහා මන්දිර හැමතැනම වෙසේ
පෙන්වා අනිස බව ලොව සත්වගට මෙසේ
වතුරෙන් හැදුන ලුණු ඒ වතුරටම නැසේ

දියුණුව කියා හඬ තැළුවත් ඉහළ නැග
අවසානයම එය වෙයි බිම වැටෙන දිග
අවිගත් එකා එම අවියෙන් නැසෙන වග
පැහැදිලි කරයි දහමේ අගතියට මග

පණ්ඩිතයා වුවත් නුසුදුසු ලෙස තැනට
කටයුතු කරයි නම් හිර වෙනු ඇත කොනට
මහරජ වැටී සමහර විට හිඟ මනට
දුගියා කිරුළ පළඳී පෙර කළ පිනට

බාදක කම්කටොළු අවහිර නොදැක ඔහේ
බැස යන ගඟේ දියසුලි හැඩ දැකිය නොහේ
සතුටින් ඉන්න මල් පිපුනා පරිදි ඉහේ
කරදර මැදින් ආ යුතු සෙල්ලමට පහේ

අහසට නගිනමුත් ගස හිරු එලිය බලා
කවදාවත්ම නෑ වැලකට තුරුළු වෙලා
තනියම කෙලින් වෙනු බැරි වැල් පඳුරු තලා
යයි ගස වටේ එතෙමින් අතු රිකිලි පලා

නීතිවේදී ගල්හේනේ විජේවර්ධන
-නවසීලන්තය-

අතර මග

පිණි වැටෙයි ඒ හඬට සිත සැළෙයි
පිණි වැටෙයි සිසිලසට සිත දැවෙයි
පිණි වැටෙයි කුමටදැයි නොම දැනෙයි
පිණි වැටෙයි වැනසුමට දෝ සිතෙයි

ඇස් වසා මේ අඳුරු බිම් පෙතේ
වස් ගණන් වුව සිටිය හැකි මෙසේ
හිස් නමා කඳුළ සඟවා නෙතේ
දොස් තබන්නේ කෙලෙස දෝ සිතේ

පරව ගිය මල් පිරුණ මලසුනේ
සැඟව ගිය සෙනෙහසේ ඉව දැනේ
තරව දෑතින් වැළඳ මා මෙසේ
තනිව ඉන්නෙමි මගේ පුදසුණේ

ගිම්හානයද සිසිරය ද කියා
ගොම්මානයද අඳුර දෝ කියා
වස්සානයද නියඟ දෝ කියා
සන්තාපයද නොදැනෙනා නියා

වයිතාල හිරු කිරණ ඇස ගැටෙයි
කවි තාල අමතකව දුක සිතෙයි
මං තාම මගහැරුණ මග දිගෙයි
කොයි කාලයක් යම්ද නොම දැනෙයි

ජගත් ජේ එදිරිසිංහ
2010 අප්‍රේල් 4

පහන් වැට

ගැඹුරැති අරුතකි මා

ලොවේ ඇරඹුම කෙලෙස වුවද
මාත් සිටියා යුග ගණන්
කවි සිතක ඉපදී ගලා ආ පද
කුරුටු ගෑවිට පොත් අගින්
රසය වැඩි කර අරුත් දුන්නා
තුඩගේ දැවටි පන්හිඳෙන්

පෙමින් වෙලෙනා තුරුණු
හදවත් තෙමා මුදු සිසිලෙන්
නිබඳ නැඟෙනා නැගී බිඳෙනා
සයුරු රළ අතරින්
සඟවලා මා උන්ගේ කඳුළත්
අරන් ගියේ රහසින්

ලොව අසම ලෙස බෙදී ගියමුත්
උස් පහත් අයුරින්

ඇතත් මිනිසුන් නේක වෙස් ගෙන
සුදු කළුද කියමින්
සසල ලොව තුල මගේ රසය දෙමි
සැමට සම ලෙසකින්

මිනිස් අතකින් වුනත් දූෂිත
කැළි කසළ දුඟදින්
නැඟෙන රළ පෙළ තබා එයි එය
වෙරළ ඉම කොනකින්
සැමට දූන් ඒ අරුත් සිතුවිළි
අඩු වුනේ නැත හදවතින්

නුඹ පෙර දිනක හමුවී
සුරත ගෙන ඇගේ
කනට කියු රහසේ
සැඟවිලා තිබූ අරුත තිබුනේ
මහද දිය ගැඹුරේ
මට කියනු මැන කෙලෙසදෝ
ඒ සෙනෙහේ දිය සිඳුනේ?

කේ නයනා එල් පෙරේරා